**ඇල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 18 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ඔක්තෝබර් 20 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ඇල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශුද්ධ වත්කම්වල අඩුවීම

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ශුද්ධ වත්කම්වල වටිනාකම රු.9,338,204 ක් වූ අතර ඉකුත් වර්ෂය අවසානයට ශුද්ධ වත්කම්වල වටිනාකම රු.11,457,662 ක් වූයෙන් එහි ශුද්ධ අඩුවීම රු.2,069,458 ක් විය.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂය තුල ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් කර්මාන්ත සඳහා ලැබුණු රු.1,332,022 ක මුදලක් ගෙවිය යුතු මුද්දර බදු තැන්පත් ගිණුමට බැරකිරීම නිසා වර්ෂයේ ආදායම එම වටිනාකමින් අඩුවෙන් ද ආපසු ගෙවිය යුතු තැන්පතු ගිණුම් ශේෂය එම වටිනාකමින් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය වාරික ලෙස ගෙවිය යුතුව තිබූ ණය වාරික වෙනුවෙන් වෙන්කිරීම් කිරීම සඳහා රු.452,355 කින් දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුම හර කර ණයහිමි ගිණුම බැර කළ යුතු වුවද, ජර්නල් සටහන් අංක 52 මඟින් රු.625,693 කින් දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කිරීම නිසා වර්ෂය අවසානයට ණයහිමි ශේෂය රු.452,355 කින් අඩුවෙන් ද දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුම් ශේෂය රු.173,338 කින් අඩුවෙන් ද සමුච්චිත අරමුදල් ගිණුම් ශේෂය රු.625,693 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.100,000 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂය රු.896,209 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.142,541 ක් වූ කඩ කුලී හිඟය රු.69,289 ක් ලෙස රු.73,252 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබූ බැවින් වර්ෂය අවසානයට ආදායම් ණයගැති ශේෂය එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සභාව වෙත ලැබී තිබූ උපලේඛණ අනුව 2013 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.800,007 ක් වුවද එය රු.675,857 ක් ලෙස රු.124,150 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර මුදල රු.3,710,216 ක් වුවද එය රු.4,325,029 ක් ලෙස රු.614,813 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) 2012 වර්ෂයේ දී ජර්නල් සටහන් අංක 56 මඟින් සිදුවූ වරද නිවැරදි කිරීම ලෙස දක්වා සමාලෝචිත වර්ෂයේ ජර්නල් සටහන් අංක 27 මඟින් රු.132,092 කින් හිඟ හිටි වරිපනම් ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැරකර තිබූ නමුත්, ඉකුත් වර්ෂයේ අදාල ජර්නල් සටහන් මඟින් එවැනි ගිණුම් තැබීමක් සිදුකර නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂය අවසානයට ආදායම් ණයගැති ශේෂය සහ සමුච්චිත අරමුදල් ගිණුම් ශේෂය එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) ජර්නල් සටහන් අංක 47 මඟින් පෙර වර්ෂවලදී ලැබිය යුතු ආදායම් වෙනුවෙන් කරන ලද වෙන් කිරීම් ඒවා ලැබීමේ දී ගිණුම්වල ගැලපීම් කර නොතිබීම නිවැරදි කිරීම සඳහා, අදාල අය ශීර්ෂයන් හා පෙර වර්ෂවල දී සටහන් කළ ආකාරය නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව රු.1,106,864 කින් සමුච්චිත අරමුදලේ ගිණුම හර කර හිඟ හිටි වෙනත් ආදායම් ගිණුම බැර කර තිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සේවක ණය ගිණුමේ ශේෂය රු. 698,993 ක් වුවද, උපලේඛණය අනුව එය රු. 773,839 ක් වූයෙන් රු. 74,846 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 12,946,463 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.16,916,489 ක් විය.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.29,453,134 ක් වටිනා ගිණුම් විෂයයන් 06 ක් විස්තරාත්මක උපලේඛණ, සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ පැවරුම් නියෝග ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2012 දෙසැම්බර් 31 දිනැති අංක 1790 දරන ගැසට් නිවේදනය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | පනතේ විධිවිධාන ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන ගොස් තිබූ ව්‍යාපාර 25 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබූ අතර බලපත්‍ර ලබාගෙන තිබූ ව්‍යාපාර 13 ක බලපත්‍රවල වලංගු කාලය ඉක්මවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සභාව සතු කඩ කාමර 19 ක මාසික බදු කුලී රජයේ තක්සේරුකරුවකු හෝ පළාත් පාලන ආයතන සම්බන්ධ තක්සේරුකරුවකු මඟින් තක්සේරු කරවාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.145,807 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.768,887 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි ශුද්ධ අඩුවීම රු.914,694 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.914,694 ක ශුද්ධ අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වරිපනම් හා බදු | 6,934,196 | 5,071,707 | 1,862,489 | |
| කුලී | 2,122,912 | 1,579,330 | 543,582 | |
| බලපත්‍ර ගාස්තු | 559,850 | 1,123,875 | (564,025) | |
| සේවා සඳහා ගාස්තු | 3,728,191 | 6,860,305 | (3,132,114) | |
| වරෙන්තු ගාස්තු හා දඩ | 440,677 | 723,045 | (282,368) | |
| වෙනත් ආදායම් | 120,330 | 174,596 | (54,266) | |
| ආදායම් ආධාර | 13,706,148 | 10,131,379 | 3,574,769 | |
| | | | | 1,948,067 |
| **පුනරාවර්තන වියදම** | | | | |
| වැටුප් හා දීමනා | 19,459,011 | 16,158,852 | (3,300,159) | |
| ගමන් වියදම් | 485,497 | 609,286 | 123,789 | |
| සැපයුම් හා උපකරණ | 3,334,562 | 1,875,502 | (1,459,060) | |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 1,662,216 | 2,131,981 | 469,765 | |
| ප්‍රවාහන සම්බන්ධතා, ආවශ්‍යක හා වෙනත් සේවා | 1,372,162 | 2,420,876 | 1,048,714 | |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 651,076 | 727,716 | 76,640 | |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 344,838 | 457,005 | 112,167 | |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 448,749 | 514,132 | 65,383 | |
| | | | | (2,862,761) |
| මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම | | | | (914,694) |

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

(අ) 2013 ජනවාරි 01 දිනට පැවති අක්කර බදු හා සතිපොල බදු කුලී හිඟයෙන් කිසිම මුදලක් 2013 දෙසැම්බර් 31 වන විට අයවී නොතිබූ අතර වරිපනම් බදු හිඟයෙන් 34% ක් හා ගල්වල බදු කුලී හිඟයෙන් 11% ක් පමණක් අයවී තිබූ බැවින් හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා අසතුටුදායක බව නිරීක්ෂණය විය.

(ආ) සභා බල ප්‍රදේශය තුල ස්ථාපනය කර ඇති දුරකථන සන්නිවේදන කුළුණු පවත්වාගෙන යාම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගෙන නොතිබුණි.

2.3.2 **බදු කුලී**

(අ) සභාව සතු කඩ කාමර 06 ක බදුකරුවන් විසින් මාස 10 කට වැඩි කාලයක් සඳහා බදු කුලී ගෙවීම පැහැර හැර තිබුණද, අදාල බදු ගිවිසුම්වල විධිවිධාන ප්‍රකාරව එම හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු දෙමෝදර ගල්වල බදුගත් බදුකරුවන්ගෙන් පෙර වර්ෂවලට අදාලව අයවිය යුතු රු.383,585 ක හිඟ බදු කුලී අදාල බදු ගිවිසුම්හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අයකරගෙන නොතිබුණි.

2.3.3 **ජල ගාස්තු**

සභාව විසින් නඩත්තු කර පවත්වාගෙන යනු ලබන හීල්ඔය ජල යෝජනා ක්‍රමය යටතේ ගාස්තු අයවීම්, එහි අනෙකුත් නඩත්තු වියදම් හැර විදුලි බිල පමණක්වත් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වූ අතර, සභාව සතු අනෙකුත් ජල යෝජනා ක්‍රමවලද ගාස්තු අයවීම් සතුටුදායක නොවන බව නිරීක්ෂණය විය.

2.3.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවිදඩ හා මුද්දර ගාස්තු රු.2,457,828 ක් අයවිය යුතුව තිබුණි. විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 675,857 |
| මුද්දර ගාස්තු | 1,781,971 |

2.3.5 වෙනත් ආදායම්

2012 දෙසැම්බර් 31 දිනැති අංක 1790 දරන ගැසට් නිවේදනය මඟින් සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යන සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ලැගුම්හල් සහිත හෝටල්වලින් ඒවායේ අදාල වර්ෂයට පෙර වර්ෂයේ ආදායමින් සියයට 01 ක් නොඉක්මවන ගාස්තුවක් අයකර ගන්නා බව සභාව විසින් ප්‍රකාශයට පත්කර තිබුණද, ඇල්ල නගරයේ පිහිටි ලැගුම්හලකින් එසේ ගාස්තු අයකර ගෙන නොතිබුණි.

3. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛණය තථ්‍ය දත්තයන් සමඟ සැසඳීමේ දී සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය